**විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකායේ මූලිකත්වයෙන් අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය , කොළඹ ක්‍රමය සහ ඩයලොග් ඇක්සියාටා පුද්ගලික සමාගම එක්ව සංවිධානය කරනු ලබන සමස්ත ලංකා චිත්‍ර සහ සජීවීකරණ වීඩියෝ තරඟාවලිය**

**"මත්ද්‍රව්‍ය වලින් තොර දීප්තිමත් අනාගතයක් සඳහා ළමුන් සහ තරුණ පරපුර බලගැන්වීම"**

විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකායේ මූලිකත්වයෙන් අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, කොළඹ ක්‍රමය සහ ඩයලොග් ඇක්සියාටා පුද්ගලික සමාගම එක්ව 2024 වසරේ සමස්ත ලංකා චිත්‍ර හා සජීවීකරණ වීඩියෝ තරඟාවලියක් සංවිධානය කරනු ලබයි.

| තරඟාවලිය | මාතෘකාව |
|---|---|
| **චිත්‍ර තරඟාවලිය**<br>පළමු කාණ්ඩය- 6,7,8 පාසල් ශ්‍රේණි<br>දෙවන කාණ්ඩය - 9,10,11 පාසල් ශ්‍රේණි | **"මත්ද්‍රව්‍ය වලින් තොර දීප්තිමත් අනාගතයක් සඳහා ළමුන් සහ තරුණ පරපුර බලගැන්වීම"** |
| **සජීවීකරණ වීඩියෝ තරඟාවලිය**<br>පළමු කාණ්ඩය- 10,11,12,13 පාසල් ශ්‍රේණි<br>දෙවන කාණ්ඩය - අවු 19 සිට 30 දක්වා වයස් සීමාවන් | |

**<u>ජයග්‍රාහකයින් සඳහා වන ත්‍යාග</u> :**

**චිත්‍ර තරඟාවලිය**

- පළමු ස්ථානය (එක් කාණ්ඩයකින් එක් ජයග්‍රාහකයකු බැගින්) - රු.50,000 ක මුදල් ත්‍යාගයක් පිරිනැමේ.
- දෙවන ස්ථානය (එක් කාණ්ඩයකින් එක් ජයග්‍රාහකයකු බැගින්) - රු.35,000 ක මුදල් ත්‍යාගයක් පිරිනැමේ.
- තෙවන ස්ථානය (එක් කාණ්ඩයකින් එක් ජයග්‍රාහකයකු බැගින්) - රු.20,000 ක මුදල් ත්‍යාගයක් පිරිනැමේ.
- එක් කාණ්ඩයකින් ජයග්‍රාහකයන් දහදෙනෙකු බැගින් ජයග්‍රාහකයින් විසිදෙනෙකු සඳහා කුසලතා සහතිකපත්‍ර ද පිරිනැමේ.

**සජීවීකරණ වීඩියෝ තරඟාවලිය**

පළමු කාණ්ඩය

- පළමු ස්ථානය - ශිෂ්‍ය/ශිෂ්‍යා සඳහා රු. 100,000.00 ක ත්‍යාග මුදලක් හා පාසල සඳහා රු. 100,000.00 ත්‍යාග මුදලක් පිරිනැමේ.
- දෙවන ස්ථානය - ශිෂ්‍ය/ශිෂ්‍යා සඳහා රු.75,000.00 ක ත්‍යාග මුදලක් හා පාසල සඳහා රු. 75,000.00 ත්‍යාග මුදලක් පිරිනැමේ.
- තෙවන ස්ථානය - ශිෂ්‍ය/ශිෂ්‍යා සඳහා රු. 50,000.00 ක ත්‍යාග මුදලක් හා පාසල සඳහා රු. 50,000.00 ත්‍යාග මුදලක් පිරිනැමේ.
- තවද ජයග්‍රාහකයින්/ජයග්‍රාහිකාවන් 05 දෙනෙකු සඳහා කුසලතා සහතිකපත්‍ර පිරිනැමේ.

දෙවන කාණ්ඩය

- පළමු ස්ථානය - රු. 200,000.00 ක වටිනාකමකින් යුත් ජංගම දුරකථන ත්‍යාගයක් පිරිනැමේ.
- දෙවන ස්ථානය - රු. 150,000.00 ක වටිනාකමකින් යුත් ජංගම දුරකථන ත්‍යාගයක් පිරිනැමේ.
- තෙවන ස්ථානය - රු. 100,000.00 ක වටිනාකමකින් යුත් ජංගම දුරකථන ත්‍යාගයක් පිරිනැමේ.
- තවද ජයග්‍රාහකයින්/ජයග්‍රාහිකාවන් 05 දෙනෙකු සඳහා කුසලතා සහතික පිරිනැමේ.

**<u>තරඟ නීතිරීති සහ කොන්දේසි</u>**

**චිත්‍ර තරඟාවලිය**

- 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සහභාගී විය හැක.
- එක් තරඟකරුවෙක්ට ඉදිරිපත් කල හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- සියලුම නිර්මාණ A3 ප්‍රමාණයේ කඩදාසි මත සිදු කළ යුතු අතර, ඕනෑම මාධ්‍යයක් (පැස්ටල්, දියසායම් වැනි) භාවිත කළ හැකිය.
- සිතුවම් රාමු නොකළ යුතුය.
- ඔබගේ නිර්මාණය, විදුහල්පතිතුමා/විදුහල්පතිතුමිය විසින් ඔබගේම නිර්මාණයක් බවට සහතික කළ යුතුය.
- ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ පහත සඳහන් විස්තර සඳහන් කළ යුතුය.
    - තරඟකරුගේ නම
    - පාසලේ නම
    - ශ්‍රේණිය
    - කාණ්ඩය (1 හෝ 2)

- සියලු නිර්මාණ 2024 ඔක්තෝබර් 31 වන දින හෝ ඊට ප්‍රථම විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බළකාය, නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 යන ලිපිනයට තැපැල් මගින් හෝ ගෙනැවිත් භාරදිය යුතුය.
- සියලුම සිතුවම් සමඟ පහත දක්වා ඇති අයදුම්පතද සම්පූර්ණ කර එවිය යුතුය.
- තෝරාගත් සිතුවම් විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකායේ ප්‍රකාශන සඳහා යොදා ගැනේ.

**සජීවීකරණ වීඩියෝ තරඟාවලිය**

- 10 සිට 13 දක්වා පාසල් ශ්‍රේණි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් හා වයස අවුරුදු 19 සිට 30 දක්වා තරුණ/තරුණියන්ට තරඟය සඳහා සහභාගි විය හැකිය.
- තනිව හෝ කණ්ඩායම් වශයෙන් සජීවීකරණ වීඩියෝ ඉදිරිපත් කල හැකිය. (කණ්ඩායම් සඳහා ප්‍රධාන ඉදිරිපත් කරන්නෙක් මඟින් අයදුම් කල යුතුයි)
- සජීවීකරණ වීඩියෝ සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම භාෂාවක් භාවිතා කළ හැකිය.
- එක් අයෙකු /කණ්ඩායමක් හට ඉදිරිපත් කල හැකි උපරිම සජීවීකරණ වීඩියෝ ගණන එකකි.
- වීඩියෝව නම් කිරීමේදි (File name) පළමු කාණ්ඩය හෙවත් පාසල් අංශය යටතේ නිර්මාණ ඉදිරිපත් කරන්නේ කණ්ඩායමක් වශයෙන් නම් එහි ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ නමෙහි මුල් අකුරු හා පාසලේ නම භාවිතා කල යුතු අතර, දෙවන කාණ්ඩය හෙවත් විවෘත අංශයේ යටතේ වන ඉදිරිපත් කරන්නන් කණ්ඩායමේ ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ නමෙහි මුල් අකුරු හා ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කළ යුතුය.
- සියලුම තොරතුරු හුවමාරු කිරීම ප්‍රධාන ඉදිරිපත් කරන්නා හරහා සිදු කෙරේ.
- සියලුම වීඩියෝ තත්පර 5 ක් පමණ වන සම්පූර්ණ තිරය සහිත 'මාතෘකා තිරයකින්' ආරම්භ කලයුතු අතර, එහි පහත විස්තර අඩංගු කළ යුතුය.

    - ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ මුලකුරු සමඟ නම
    - පාසලේ නම (පළමු කාණ්ඩය සඳහා පමණයි)
    - ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ පෞද්ගලික ලිපිනය (දෙවන කාණ්ඩය සඳහා පමණයි)
    - තරඟකරු සමඟ සම්බන්ධ විය හැකි දුරකථන අංකයක් (WhatsApp පහසුකම් සහිත දුරකථන අංකයක් වඩාත් යෝග්‍ය වේ)
    - ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය (දෙවන කාණ්ඩය සඳහා පමණයි)

- වීඩියෝ ගොනු වර්ගය (File Format) MP4 හෝ AVI විය යුතුය
- සජීවීකරණ වීඩියෝවක් සඳහා අවම කාලය තත්පර 15 ක්ද, උපරිම කාලය තත්පර 50 ක්ද විය යුතුය.
- අන්තර්ගත දර්ශන සියලු වයස්වල ප්‍රේක්ෂකයින් සඳහා සුදුසු විය යුතුය.
- අන්තර්ගතය ජාතික නීති පද්ධතියට අනුගත විය යුතු අතර, පහත කරුණු අන්තර්ගත නොවිය යුතුය.

    - නීත්‍යානුකූල නොවන හැසිරීම් ප්‍රවර්ධනය වීමක්
    - වාර්ගික, ආගමික, ලිංගික, දේශපාලනික හෝ වෙනත් ගැටුම් සඳහා උපකාරී වීමක්
    - ලිංගිකත්වය උත්තේජනය හෝ කලහකාරිත්වයක් නිර්මාණය වීමක්
    - නීතිය හෝ අයිතීන් උල්ලංඝනය වීමක්
    - යම් අයෙකුගේ පෞද්ගලිකත්වය ආක්‍රමනය කිරීමක්
    - විෂමත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය විසින් තීරණය කරනු ලබන පරිදි වෙනත් ආකාරයකින් නුසුදුසු වීම.

- සජීවීකරණ වීඩියෝව එහි මුල් පිටපත විය යුතුය.
- ප්‍රකාශනමය අයිතීන් උල්ලංඝණය වන වාණිජමය අන්තර්ගතයන් (උදා: සංගීත, වීඩියෝ හා සජීවිකරනය) අඩංගු නොවිය යුතුය.
- වීඩියෝ නිර්මාණයේදී වෘත්තීය සහය ලබාගත නොහැක.
- තේමාවේ අන්තර්ගතය සජීවිකරණ වීඩියෝව තුළ ඇතුළත් වීම අනිවාර්ය වේ.
- ඔබගේ නිර්මාණය ඔබගේ Google drive එකට උඩුගත (upload) කල යුතු අතර, එහි සබැඳිය (link) මෙම විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය - taskforceantinarcotics@gmail.com.
    - විද්‍යුත් තැපැල් ලිපිනයේ විෂයයෙහි (subject), පහත තොරතුරු ඇතුලත් විය යුතුය
        - පළමු කාණ්ඩය - ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ නම සහ පාසලේ නම
        - දෙවන කාණ්ඩය - ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය

- ○ පහත දක්වා ඇති අයදුම් පත්‍රයද සම්පූර්ණ කර සජීවිකරණ වීඩියෝ පටයෙහි සබැඳිය (Link) සමඟ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතුය.

- සජීවීකරණ වීඩියෝ භාරගන්නා අවසාන දිනය වනුයේ 2024 ඔක්තෝබර් 31 වන දිනයි.
- සජීවීකරණ වීඩියෝවේ හිමිකාරිත්වය නිර්මාණකරු සතුවේ. එනමුත් මෙම වීඩියෝව භාවිත කිරීමේ, නැවත නිෂ්පාදනය කිරීමේ, බෙදා හැරීමේ සහ ප්‍රදර්ශනය කිරිමේ අයිතිය විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්යසාධක බලකාය සතුව පවතී.
- සජීවීකරණය සඳහා භාවිත කරන ලද සියලුම වීඩියෝ, ඡායාරූප හා අනෙකුත් ආධාරක (ත්‍රිමාණ රූප වැනි) හා සජීවිකරණය කරන ලද මුල් ගොනුව (Project File) ඉහත විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවිය යුතුය.
- ඒ සමගම සජීවිකරණය සඳහා භාවිතා කල මෘදුකාංග හා අතිරේක ප්ලගින්ස් (3rd Party Plugins) පිළිබඳ සම්පූර්ණ විස්තරයක් එවිය යුතුය.
- ඉදිරිපත් කරන වීඩියෝපටය Full HD (1920x1080) හෝ ඒ හා සමාන ප්‍රමාණයකින් ඉදිරිපත් කිරීමට නිදහස ඇත.
- කෘතිම බුද්ධි (Artificial Intelligence) මෘදුකාංග භාවිත කිරීමෙන් සිදු කරන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**විනිශ්චය නිර්නායක**

- ප්‍රවීන විනිසුරුවරුන්ගෙන් සමන්විත විනිසුරු මඬුල්ලක් විසින් තරඟය විනිශ්චය කරනු ලබයි.
- විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**විනිශ්චය කිරීමේ නිර්නායක**

- අදාළත්වය - තරඟයේ තේමාව අන්තර්ගත වීම
- පැහැදිලි බව - තොරතුරු පැහැදිලිව හා හොඳින් ප්‍රකාශ වීම
- නව ඉදිරි දර්ශනය - පණිවිඩය නව ඉදිරි දර්ශනයක් ලබා දෙන්නේද? (අදහසේ නිර්මාණශීලිත්වය)
- නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදනය - ඉදිරිපත් කිරීම තුල සැපයුම්, ද්‍රව්‍ය සහ අදහස් ඒකාබද්ධ නව්‍ය භාවිතයෙන් ප්‍රදර්ශනය කළේද? (සම්පූර්ණ නිෂ්පාදනයේ නිර්මාණශීලිත්වය)
- ඵලදායිතාවය - පණිවිඩය ලබා දීමේ සමස්ත ඵලදායීතාවය
- ආකර්ශණීය බව - නරඹන්නාගේ අවධානය දිනාගත හැකි බව.
- තාක්‍ෂණික ගුණාත්මකභාවය - සංස්කරණයේ ගුණාත්මකභාවය

**තොරතුරු සහ අයදුම්පත්‍රය බාගත කිරීම සඳහා**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වෙබ් අඩවිය බලන්න - nddcb.gov.lk

**අමතන්න -**

චිත්‍ර තරඟාවලිය - ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) ජේවීපීජ් චින්තක (0763003905)
සජීවිකරණ වීඩියෝ තරඟාවලිය - ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) ලක්ෂිත රාජපක්ෂ (0714572515)
කාර්යාලය - 0117192100

විද්‍යුත් තැපැල:taskforceantinarcotics@gmail.com

- සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි ලේඛනයන්හි භාෂාමය විෂමතාවයන් ඇත්නම් සිංහල භාෂාවෙන් සඳහන් ලේඛනයේ තොරතුරු අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්වේ.

**පාසල් තරඟකරුවන් සඳහා වන අයදුම්පත්‍රය**
**සමස්ත ලංකා චිත්‍ර සහ සජීවීකරණ වීඩියෝ තරඟාවලිය 2024**

1. ඉදිරිපත් කරන්නාගේ සම්පූර්ණ නම (සහතික පත්‍රයේ සඳහන් විය යුතු ආකාරයට):

2. ඉදිරිපත් කරන්නාගේ වයස:

3. සජීවීකරණ වීඩියෝ තරඟාවලිය සඳහා අයදුම් කරනු ලබන පළමු කාණ්ඩයට අයත් කණ්ඩායම් සාමාජිකයන්ගේ නම් සහ ඔවුන්ගේ ශ්‍රේණි ඉදිරිපත් කල යුතුයි. (කණ්ඩායමක් වශයෙන් නිර්මාණ ඉදිරිපත් කරන්නන් සඳහා පමණයි)

අ.
ආ.
ඇ.
ඈ.
ඉ.
ඊ.

4. පාසලේ විස්තර

අ. නම:
ආ. ලිපිනය:
ඇ. දුරකථන අංකය:

5. තරඟ අංශය (ගැලපෙන කොටුව සලකුනු කරන්න)

චිත්‍ර තරඟාවලිය ☐
සජීවීකරණ විඩියෝ තරඟාවලිය ☐

6. කාණ්ඩය (ගැලපෙන කොටුව සලකුනු කරන්න)

පළමු කාණ්ඩය ☐
දෙවන කාණ්ඩය ☐

7. මව/පියා/භාරකරුගේ අවසරය

මව/පියා/භාරකරුගේ නම:
දුරකථන අංකය:
මාගේ දරුවා මෙම තරඟාවලියට සහභාගී කරවීමට කැමැත්ත ලබාදෙමි.

....................................
මව/පියා/භාරකරුගේ අත්සන

8. පාසලේ විදුහල්පතිතුමාගේ/විදුහල්පතිතුමියගේ සහතිකය

මෙම නිර්මාණය ඉහත නම සඳහන් ඉදිරිපත්කරන්නාගේම නිර්මාණයක් බව සහතික කරමි.

...................... ...............................................................................
දිනය විදුහල්පතිතුමාගේ/විදුහල්පතිතුමියගේ නම, අත්සන සහ නිල මුද්‍රාව

## විවෘත අංශයේ තරඟකරුවන් සඳහා අයදුම්පත්‍රය
## සමස්ත ලංකා චිත්‍ර සහ සජීවීකරණ වීඩියෝ තරඟාවලිය 2024

1. ඉදිරිපත් කරන්නාගේ සම්පූර්ණ නම (සහතික පත්‍රයේ සඳහන් විය යුතු ආකාරයට):

2. ඉදිරිපත් කරන්නාගේ වයස:

3. අයදුම් කරනු ලබන දෙවන කාණ්ඩයට අයත් තරුණ/තරුණියන් විසින් නම් සහ ජාතික හැඳුනුම්පත් අංක ඉදිරිපත් කල යුතුය. (කණ්ඩායමක් වශයෙන් නිර්මාණ ඉදිරිපත් කරන්නන් සඳහා පමණයි)

අ.
ආ.
ඇ.
ඈ.
ඉ.
ඊ.

4. ඉදිරිපත් කරන්නාගේ පෞද්ගලික ලිපිනය:

5. මා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත් මෙම නිර්මාණය මා විසින් සකස් කරන ලද්දක් බවටත් ප්‍රකාශ කෙරේ.

.................... ..........................................................................

දිනය ප්‍රධාන ඉදිරිපත් කරන්නාගේ අත්සන හා ජාතික හැඳුනුම්පත් අංකය

දුරකථන අංකය - ............................ (ප්‍රධාන ඉදිරිපත් කරන්නා සම්බන්ධ කරගත හැකි WhatsApp පහසුකම් සහිත දුරකථන අංකයක් වඩාත් සුදුසුවේ)